**විසි එක් වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය - 2015**

විසි එක් වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතියේ (HETC) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංස) අතර 2010 අගෝස්තු 26 දින එළඹි අංක 4686 - එල්කේ දරන ණය ගිවිසුමේ 2 ආ (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාධාරණ සමාජයීය හා ආර්ථික සංවර්ධන අවශ්‍යතා අරමුණු කරගත් ගුණාත්මක උසස් අධ්‍යාපන සේවා බෙදා හැරීම පිණිස ග්‍රාහකයාගේ උසස් අධ්‍යාපන පද්ධතිය, ආයතනයන් හා මානව සම්පත්වල ධාරිතාවය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. උසස් අධ්‍යාපන අංශය සඳහා වූ නියමයන් ආයතනගත කිරීම, ඉගැන්වීමේ හා ඉගෙනීමේ අදාළ බව හා ගුණාත්මක බව ප්‍රවර්ධනය කිරීම, විකල්ප උසස් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම හා ශක්තිමත් කිරීම සහ මානව සම්පත් සංවර්ධනය, නියාමනය, ඇගයීම, අධ්‍යයන, සම්බන්ධීකරණය හා සන්නිවේදනය යනාදී වශයෙන් ප්‍රධාන සංරචක හතරකින් ව්‍යාපෘතිය සමන්විත වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,930 කට සමාන එජඩො මිලියන 40 ක් වූ අතර ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මුළු පිරිවැය සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 නොවැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර, 2015 දෙසැම්බර් 31 වනවිට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2016 ජුනි 30 දක්වා දීර්ඝ කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක්

ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන්, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඒ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය තුළ කරන ලද ගනුදෙනු මත මුදල් ප්‍රවාහය පිළියෙල කරනු වෙනුවට සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ සිදුකරන ලද ගනුදෙනු මත ව්‍යාපෘතියේ මුදල් ප්‍රවාහය පිළියෙල කර තිබුණි.

**3.** **මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1** **අරමුදල් උපයෝජනය**

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණයගිවිසුමේ මුලායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජා සං සං | 40.00 | 4,930.06 | 1,908.58 | 10.51 | 1,365.03 | 33.25 | 4,312.83 |
| එකතුව | 40.00 | 4,930.06 | 1,908.58 | 10.51 | 1,365.03 | 33.25 | 4,312.83 |

ඉහත තොරතුරු අනුව, 2015 දෙසැම්බර් 31 දිනට වෙන් කිරීම්වලින් සියයට 83 ක් ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබූ අතර එදිනට සංරචක වශයෙන් අරමුදල් උපයෝජනය සියයට 55 සිට සියයට 88 දක්වා පරාසයක විය. තවද උසස් අධ්‍යාපන අංශය සඳහා වූ නියමයන් ආයතනගත කිරීමේ සංරචකය යටතේ වෙන් කරන ලද රු.මිලියන 83.16 කින් රු.මිලියන 45.89 ක්වූ අරමුදල් උපයෝජනය කිරීම පිළිබඳ මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ කාර්යයන් ප්‍රධාන සංරචක 04 ක් යටතේ සිදු කර තිබූ අතර එහි භෞතික ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල සිසුන්ට ඉංග්‍රීසි භාෂාව හා තොරතුරු තාක්ෂණය සඳහා අධ්‍යයන වැඩසටහනක් ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලදී. ඉංග්‍රීසි භාෂා අධ්‍යයන වැඩසටහන සඳහා සිසුන් 29,376 ක් හා තොරතුරු තාක්ෂණය අධ්‍යයන වැඩසටහන සඳහා සිසුන් 24,688 ක් 2013 හා 2014 වර්ෂවල ලියාපදිංචි වී තිබුණද, ඉංග්‍රීසි භාෂාව සඳහා වැඩසටහනේ සිසුන් 3,330 ක් හා තොරතුරු තාක්ෂණය සඳහා වැඩසටහනේ සිසුන් 541 ක් පමණක් අධ්‍යයන වැඩසටහන සාර්ථකව නිම කර තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ විකල්ප උසස් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම හා ශක්තිමත් කිරීම සංරචකය යටතේ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සඳහා ගුණාත්මක සංවර්ධනය හා නායකත්ව මධ්‍යස්ථානයක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ වැඩවලින් 2016 මැයි 31 වන විටත් නිම කර තිබුණේ සියයට 60 ක් පමණක් විය. ලැබුණු තොරතුරු අනුව ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ 2016 ජූනි 30 දිනට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි.

(ඇ) උසස් තාක්ෂණික ආයතනවල හා විශ්වවිද්‍යාලවල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 240 දෙනෙකුට පශ්චාත් උපාධි අධ්‍යයනයන් 2015 දෙසැම්බර් 31 ට පෙර සම්පූර්ණ කිරීම සඳහා රු.මිලියන 366.86 ක ආධාර සලසා දී තිබූ අතර 2016 ජුනි 30 දක්වා එය දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද එකතුව රු.මිලියන 16.83 ක ආධාර ලැබූ උසස් තාක්ෂණ ආයතනවල ආධාරලාභීන් 4 දෙනෙකු හා විශ්වවිද්‍යාලවල ආධාරලාභීන් 10 දෙනෙකු ඔවුන්ගේ අධ්‍යයන කටයුතු 2016 මැයි 31 දිනට ද සම්පූර්ණ කර නොතිබුණි.

(ඈ) උසස් අධ්‍යාපන අංශය සඳහා වූ නියමයන් ආයතනගත කිරීම සංරචකය යටතේ 2012 වර්ෂය අවසානයට මුද්‍රණය කර බෙදාහැරීම සඳහා අපේක්ෂා කරන ලද "ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව" ප්‍රකාශනය 2015 දෙසැම්බර් 31 වන විටත් විශ්ව විද්‍යාලවලට බෙදා හැර නොතිබුණි.

**3.3 මතභේදයට තුඩුදෙන කරුණු**

-----------------------------------

වර්තමාන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට උපදෙස් දීම සඳහා හිටපු ව්‍යාපෘති අධ්‍යක්ෂ 2014 සැප්තැම්බර් 15 දින සිට ව්‍යාපෘතියේ උපදේශකවරයකු ලෙස පත්කර සමාලෝචිත වර්ෂයේ මාස තුනක කාලයක් සඳහා රු.180,000 ක මුදලක් ගෙවා තිබුණි.

**3.4 මූල්‍ය පාලන ගැටලු**

------------------------

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ 2010 ජුනි 07 දිනැති අංක 9/2010 චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව, පෙට්‍රල් වාහනයක් සඳහා කිලෝ මීටරයකට රු.29.25 බැගින් හා ඩීසල් වාහනයක් සඳහා රු.24.50 බැගින් ව්‍යාපෘතියේ නිලධාරීන් සඳහා ප්‍රවාහන දීමනා ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. එබැවින් සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ අදාළ නිලධාරීන්ට රු.80,366 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.5 පරිබාහිර ගෙවීම්**

-------------------

ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා මැදිහත් නොවූ විශ්වවිද්‍යාලවල මෙහෙයුම් සේවා ඒකකවලට අනුයුක්ත කරන ලද ව්‍යාපෘති සහකාර, ව්‍යාපාර සංවර්ධන සහකාර හා තාක්ෂණික සහකාරවරුන් සඳහා ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.මිලියන 10.27 ක පාරිශ්‍රමික ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. තවද එම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සේවක සංඛ්‍යාවෙහි ඇතුළත් නොවිය.